# -දැන්වීමයි-

## උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ජනපද නිලධාරි (අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය) III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026**

1. උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ජනපද නිලධාරි (අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය) III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු 09ක් සඳහා පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ගෙන් මෙම කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2026 අගෝස්තු මස 10 දින වේ.මෙම විභාගය 2026 සැප්තැම්බර් මස දී අනුරාධපුර නගරයේ පැවැත්වීමට නියමිත වේ.ඒ සඳහා වන අයදුම්පත් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ pscncpc@gmail.com වෙබ් අඩවියෙන් භාගත කරගත හැකිය.

2. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

3. **සුදුසුකම්:-** උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ජනපද නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය

3.1 **අධ්‍යාපන සුදුසුකම්:-**

i. ක්ෂේත්‍රයට අදාළ විෂයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත/කෘෂි විද්‍යාව/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් (03) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය එකවර සමත් ව තිබීම

සහ

ii. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව,විද්‍යාව,ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.

3.2 **වෘත්තිය සුදුසුකම් :-**

i. තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමන ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව,

හෝ

ii. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තිය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම,

හෝ

iii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

3.3. **පළපුරුද්ද :-** අදාළ නොවේ.

3.4. **වයස :-** අයදුම්පත් භාර ගන්නා අවසාන වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

3.5. **කායික සුදුසුකම් :-** සෑම අයදුම්කරුවෙකුම උතුරු මැද පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිමටත් තනතුරේ රාජකාරි ඉටු කිරිමටත් සෑම අයුරකින්ම සුදුසු මනා ශාරිරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය.

3.6. **වෙනත්:-**

i. අයදුම්කරු ශ්‍රී ලංකා පුරුවැසියෙකු විය යුතුය.

ii. යම් ආගමික නිකායක පැවිදිවරයන් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

iii. අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් උතුරු මැද පළාත තුළ ස්ථිරව අඛණ්ඩව පදිංචි අයෙකු විය යුතුය. කලත්‍රයාගේ ස්ථිර පදිංචිය වුවද සලකා බැලේ. සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් උතුරු මැද පළාත තුළින් තෝරාගැනීමට නොහැකි වුවහොත් පමණක්, උතුරු මැද පළාතේ අවම වශයෙන් අවුරුදු 05ක් සේවය කිරීමට යටත්ව ජාතික මට්ටමින් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් සුදුසුකම් සලකා බලනු ලැබේ.

4. **වැටුප් ක්‍රමය :-** මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ට අනුව , MN3- 2025 රු.52,250-10X800-11X1,190-10X1,320-10X1,350-100,040 වේ. ඊට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව මාසිකව ගෙවනු ලැබේ.

5. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:-**

(අ). මෙම තනතුර ස්ථිරය. විශ්‍රම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් විටින් විට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත්වනු ඇත.

(ආ). තෝරාගනු ලබන අයදුම්කරුවන් එම අවස්ථාව වන විට රජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර නොසිටියේ නම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයකින් පසුව නියමිත කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ තනතුරෙහි ස්ථිර කරනු ඇත. රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු නම් ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වනු ඇත.

6. **භාෂා මාධ්‍ය :-** විභාගය සිංහල, දෙමළ භාෂා මාධ්‍ය දෙකෙන්ම පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

7. **අයදුම්පත්‍ර :-**

(අ). මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 (සෙ.මී.21 x 30) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය. අංක 01 සිට 03 දක්වා ශීර්ෂ පළමු වන පිටුවෙහිද, අංක 04 සිට 08 දක්වා ශීර්ෂ දෙවන පිටුවටද, ඉතිරිය ඊළඟ පිටුවලටද ඇතුළත් වන පිරිදි සකස් කර , ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව සම්පූර්ණ කළ යුතුය.

(ආ). ඉල්ලුම් පත්‍රය සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටිය භාෂා මාධ්‍යයෙනි.

(ඇ). මූලික සුදුසුකම් සපුරා නොමැති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් අසම්පූර්ණ ලෙස තොරතුරු සකස් කර ඇති හා අයදුම්පත්‍ර කැඳවන අවසන් දිනට පසුව මුදල් ගෙවූ කුවිතාන්සිය ඇතුළත් අයදුම්පත්, උතුරු මැද පළාත් දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැර වෙනත් ස්ථානවලට මුදල් ගෙවූ රිසිට්පත් සහිත අයදුම්පත්, මුදල් ගෙවූ කුවිතාන්සි අලවා නොමැති අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම කොමිෂන් සභාව වගකියනු නොලැබේ. අයදුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේක කළ බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

(ඇ). අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවරයෙකු දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඉ). නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026 අගෝස්තු 10** දිනට පෙර **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, අනුරාධපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, අනුරාධපුර උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ජනපද නිලධාරී III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය-2026"(ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කරන්න)** යන්න සඳහන් කළ යුතුය.( ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

08. **විභාග ගාස්තු:-**

(අ) මෙම විභාගය සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවෙකු විසින්ම විභාග ගාස්තු ලෙස රු.720.00 ක මුදලක්, උතුරු මැද පළාත් සභාවේ ආදායම් ශීර්ෂ අංක 2003.02.13ට බැර වන පරිදි(එන්සි 100 ආකෘතිය මඟින්) උතුරු මැද පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.මෙම දැන්වීමේ සඳහන් නොවන අයුරින් මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත් සහිත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර,කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමකින් හෝ මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් බාරගනු නොලැබේ.

(ආ) පුවත්පත් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ.තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(ඇ) විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය. තවද අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව තහවුරු කළ යුතුය.ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 07කට පෙර විභාග ප්‍රවේශ පත්‍ර නොලදහොත් එම අපේක්ෂකයින් පහත සඳහන් විස්තර ඇතිව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත හෝ දුරකථන අංක 025-2222773 ඔස්සේ දැන්විය යුතුය.

i. විභාගය
ii. අයදුම්කරුගේ සම්පූර්ණ නම
iii. සම්පූර්ණ ලිපිනය
iv. ඉල්ලුම්පත් තැපැල් කළ කාර්යාලය සහා ලියාපදිංචි කළ අංකය හා දිනය

අයදුම්පත් නොලැබීම හෝ අස්ථාන ගතවීමක් හේතුවෙන් ප්‍රවේශපත්‍ර නොලැබී ගිය හොත් ප්‍රවේශපත්‍ර ලබා ගැනීමට අයදුම්පත්‍රයේ පිටපතක් සමඟ ලියාපදිංචි කළ කුවිතාන්සියේ පිටපතක් රැගෙන කොමිෂන් සභා කාර්යාලයට අයදුම්කරු හෝ අයදුම්කාරිය විසින්ම පැමිණිය යුතුය.

09. **තෝරා ගැනීමේ ක්‍රමය:-** ලිඛිත පරීක්ෂණයක හා සමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

සටහන:-ප්‍රමුඛතා ලේඛණයක් සකස් කිරිමේදි උතුරු මැද පළාත හා වෙනත් පළාත් සඳහා වෙන වෙනම ප්‍රමුඛතා ලේඛණය සකස් කරනු ලබන අතර,උතුරු මැද පළාත් ප්‍රමුඛතා ලේඛණයට අනුව අවම සමත් ලකුණු දරන අයද තෝරා ගැනිමෙන් පසු වෙනත් සුදුසුකම්ලාභින් පිළිබඳව සලකා බලනු ලැබේ.

10. **විභාග ක්‍රමය :-** මෙම විභාගය පහත පරිදි ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතවේ.

| **විෂයයන්** | **කාලය** | **උපරිම ලකුණු** | **සමත් ලකුණු** |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40 |

විෂය නිර්දේශය -

**<u>බුද්ධි පරීක්ෂණය</u>**

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව විශ්ලේෂණ හැකියාව,කාල කළමනාකරණය,විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. සමත්වීම සඳහා 40% හෝ ඊට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

**<u>විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය</u>**

i. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය
   a. දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය
   b. රැකියා නියුක්තිය
   c. කෘෂිකර්මාන්තයේ අපනයන ආනයන තත්ත්වය

ii. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම

iii. පස සහ ශාක පෝෂණය
   a. පසේ ව්‍යුහය හා වයනය , භෞතික හා රසායනික ලවණතාවය හා භෝග වගාව කෙරෙහි එහි බලපෑම
   b. ශාක පෝෂණය , පාංශු ශාක පෝෂණ කළමනාකරණය
   c. පැළෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු

iv. පාංශු රසායනය , පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම

v. වාරිමාර්ග ක්‍රම හා ජල කළමනාකරණය
   a. විවිධ භෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය
   b. ක්ෂුද්‍ර ජල කළමනාකරණ ක්‍රම
   c. ජල වහනය හා එහි වැදගත්කම

vi. ශ්‍රී ලංකාවේ මහ ගොවි ජනපද ව්‍යාපාර හා මහවැලි ව්‍යාපාරය පිළිබඳ දැනුම
   a. ජනපද ව්‍යාපාර ඇති ස්ථාන
   b. මහවැලි ව්‍යාපාරයට අයිතිවන ප්‍රදේශ

vii. ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරිම පිළිබඳ දැනුම

viii. සිතියම් ආශ්‍රිත කරුණු පිළිබඳ දැනුම

a. අනිලමානය, ඩම්පිලෙවලය , තියෝඩර්ලයිටරය ( විකෝත්තමානය )
b. 1: 50000 , 10000 අඟලේ සිතියම් හා අවසාන ගම් පිඹුර පිළිබඳ විස්තර

ix. ශ්‍රී ලංකාවේ දැනට පවතින ඉඩම් නීති පිළිබඳ හා ඒ සම්බන්ධ දෙපාර්තමේන්තු චක්‍රලේඛ පිළිබඳ දැනුම
ඉඩම් වර්ග - රජයේ ඉඩම්
- පුද්ගලික ඉඩම්
- ප්‍රවේණි ඉඩම්

x. ඉඩම් සංවර්ධන හා බෙදාදීම පිළිබඳ දැනුම

a.වර්තමානයේ ඉඩම් සංවර්ධනය හා බෙදාදීම සම්බන්ධ ජාතික වැඩසටහන් පිළිබඳ අවබෝධය
i. ඉඩම් නොමැති පුද්ගලයන් හඳුනා ගැනිම
ii. ඉඩම් බෙදාදීම
iii. ඉඩම් කැබලි කිරිම

xi. රජ සමයේ සිට මේ දක්වා ඉඩම්වල අයිතිය බැහැර කිරිමට යොදාගත් ලේඛණ පිළිබඳ අවබෝධය
a.සන්නස්,නින්දගම්,බදුකර,ස්වර්ණ භූමි,රන් භූමි,රජබිම්

11. **සාවද්‍ය තොරතුරු ලබාදීම:-**

මෙම විභාගයට ඉදිරිපත් විම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හො ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරිමට ඉඩ ඇත.සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව සනාථ වුවහොත් ඔහු සේවයෙන් පහකිරිමට ඉඩ ඇත.

12. බඳවා ගැනිමේ කොන්දේසි තනතුරට අදාල උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ බඳවා ගැනිමේ පරිපාටියට අනුව තීරණය වේ.මෙම දැන්විමේ දෙමළ පරිවර්තනයේදි ඇති වන අනනුකුලතාවයන් සම්බන්ධයෙන් සිංහල නිවේදනය බල පැවැත්වේ.

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
අනුරාධපුර.
2026.07.17

ආදර්ශ අයදුම්පත්‍රය

**<u>උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ</u>**
**<u>ජනපද නිලධාරි 111 ශ්‍රේණිය සඳහා වන විවෘත බඳවා ගැනීම - 2026</u>**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- (සිංහල- S , දෙමළ - T , ඉංග්‍රීසි -E )

(අදාළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

ඉල්ලුම් කරන තනතුර:- තනතුරට අදාළ අංකය :-

(ජනපද නිලධාරි - 1)

(අදාල තනතුර හා අංකය කොටුව මත ලියන්න)

පදිංචි දිස්ත්‍රික්කය :-

01. 1.1 මුලකුරු සමග නම ..........................................................................................................................

Mr./Mrs./Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ( උදා:- SILVA A.B.C.D.)

1.2. මුලකුරු සමග නම ..........................................................................................................................

මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3. මුලකුරු වලින් කියවෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..........................................................................

..........................................................................................................................................................

1.4. මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :-.....................................................................................

..........................................................................................................................................................

02. 2.1. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :- ..........................................................................................

2.2. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..........................................................................

..........................................................................................................................................................

2.3. දැනට රාජ්‍ය සේවයේ නිරත අයෙකු නම් කාර්යාලීය ලිපිනය :- ……………………………………………

..........................................................................................................................................................

2.4. දුරකථන අංකය ..................................................

2.5. ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.6. ස්ත්‍රී / පුරුෂ භාවය 0- පුරුෂ , 1- ස්ත්‍රී

2.7. විවාහක / අවිවාහක බව :- අවිවාහක - 1 විවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

03. 3.1 උපන් දිනය :-

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2026.08.10) වයස අවු:- …………… මාස :- ................ දින :- ................

3.3. දුරකථන අංකය ජංගම:- ස්ථාවර :-

(විභාගය සම්බන්ධව දැනුම්දීම සඳහා)

04. අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- …………………………………………………

| ඡන්දහිමි නාම ලේඛනයට අනුව පදිංචිය | **2023** | **2024** | **2025** |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාශය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාශය | | | |
| ග්‍රාම නිලධාරී කොට්ඨාශය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

05. කාලත්‍රයාගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය(අයදුම්කරු මෙම පළාතේ වසර 03කට වඩා ස්ථිර පදිංචි අයෙකු සමඟ විවාහ වූ විට) :- ……………………………………………………………………………………………………………

| ඡන්දහිමි නාම ලේඛනයට අනුව පදිංචිය | **2023** | **2024** | **2025** |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාශය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාශය | | | |
| ග්‍රාම නිලධාරී කොට්ඨාශය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

06. අධ්‍යාපන සුදුසුකම් :-

6.1 අ.පො.ස(සාමාන්‍ය පෙළ) විභාගය:-

වසර :-.................... විභාග අංකය :-....................

| විෂය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

6.2 අ.පො.ස(උසස් පෙළ) විභාගය :-

වසර:-..................... විභාග අංකය:- ..............................

| විෂය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

07. වෘත්තිය(තාක්ෂණ) සුදුසුකම් :- (වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන ලේඛනවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | පාඨමාලාවේ කාල සීමාව | NVQ මට්ටම | NVQ සහතිකපත් අංකය | සහතිකපත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

08. වෙනත් සුදුසුකම් :-

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

09. විභාග ගාස්තු රු.720/- ගෙවීම පිළිබඳ තොරතුරු

i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම :- ..........................................................................................
ii. දිනය :- ..........................................................................................................................
iii. කුවිතාන්සි අංකය :- ..........................................................................................................................

| |
|---|
| මුදල් ගෙවූ ලදුපත නෙගැලවෙන සේ මෙම කොටුව තුළ අලවන්න<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

10. ඔබ කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේද? ..............................................................................................

"ඔව්" නම් විස්තර දන්වන්න :- ..........................................................................................................................

අයදුම්කරුගේ ප්‍රකාශය

11. මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි. තවද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

..................................................                ..............................................

දිනය                අයදුම්කරුගේ අත්සන

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ......................................................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලික දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිටදී ...................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

.........................................                                                                   ..........................................................

දිනය                                                                                      අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

(නිල මුද්‍රාව)

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම ..........................................................................................

තනතුර :- ......................................................................

ලිපිනය :- .......................................................................

13.රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.

මෙම ඉල්ලුම්කරු වන ..................................................................................................................................මහතා/මහත්මිය/ මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ..........................................................................................වශයෙන් සේවය කරයි. පසුගිය වසර 05 තුළ ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුරු සඳහා තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

දිනය ...................................                                                  ..........................................................................

දෙපාර්තමේන්තුවේ/ආයතන ප්‍රධානියාගේ අත්සන

(රබර් මුද්‍රාව සහතිව)